# Journal of Innovative Practices in Education (JIPE)
# JIPE ශාස්ත්‍රීය සංග්‍රහය

## ඉදිරිපත් කිරීමේ මාර්ගෝපදේශ

### JIPE වෙත ලිපි ඉදිරිපත් කිරීම

- ඔබගේ ලිපිය ඊමේල් ඇමුණුමක් ලෙස **edjipe@ou.ac.lk** වෙත යොමු කරන්න.

- ඉංග්‍රීසි, සිංහල, හෝ දෙමළ භාෂාවෙන් ලිපි ඉදිරිපත් කළ හැකිය.

- සිංහල/දෙමළ ඉදිරිපත් කිරීම් සඳහා ඉංග්‍රීසි භාෂාවෙන් සාරසංක්ෂේපයක් (Abstract) ඇතුළත් විය යුතුය.

- ලිපිය සමඟ වචන 200-250ක සාරසංක්ෂේපයක් (Abstract) සැපයිය යුතුය.

– ලිපිය, එහි කාණ්ඩය අනුව වචන 8000ට නොවැඩි විය යුතුය.

- ලිපිය පහත සඳහන් කාණ්ඩවලින් එකකට අයත් යුතුය: පර්යේෂණ ලිපි/සමාලෝචන ලිපි/පර්යේෂණ සන්නිවේදන (විස්තර සඳහා "ඉදිරිපත් කිරීමේ කාණ්ඩ" වෙත යොමු වන්න.)

### කර්තෘ මාර්ගෝපදේශ

**විෂය පථය**:

JIPE ශාස්ත්‍රීය සංග්‍රහය, අධ්‍යාපනයේ සහ අධ්‍යාපනයට අදාළ ඕනෑම ක්ෂේත්‍රයක, ඕනෑම මට්ටමකට අයත් අධ්‍යාපනඥයින්ගේ වෘත්තීය භාවිතයන් සහ වෘත්තීමය සංවර්ධනය පිළිබඳ නව්‍ය පර්යේෂණ ප්‍රකාශයට පත් කරනු ඇත.

**ඉදිරිපත් කිරීමේ කාණ්ඩ:**

**(අ) පර්යේෂණ ලිපි**

පර්යේෂණ ලිපි යනු මුල් පර්යේෂණ මත පදනම් වූ පූර්ණ පර්යේෂණ පත්‍රිකා වේ. එහි සාරසංක්ෂේපය (Abstract) (වචන 200-250), මුඛ්‍ය පද (key words) 3-6, හැඳින්වීම, සාහිත්‍ය විමර්ශනය, ක්‍රමවේදය, ප්‍රතිඵල සහ සාකච්ඡාව, නිගමන, නිර්දේශ, උපකාරානුස්මෘතිය (Acknowledgement) (අදාළ පරිදි) සහ APA7 ශෛලියට අනුව ආශ්‍රිත ග්‍රන්ථ ලැයිස්තුවක් අඩංගු විය යුතුය. පර්යේෂණ ලිපි සඳහා වචන සීමාව 6,000 සිට 8,000 දක්වා වේ. (රූප සටහන්, වගු, සහ ආශ්‍රිත ග්‍රන්ථ ඇතුළත්ව)

**(ආ) සමාලෝචන ලිපි**

සමාලෝචන ලිපි යනු අධ්‍යාපනයේ සහ අධ්‍යාපනඥයින්ගේ වෘත්තීය භාවිතයන්ට අදාළ, තත්කාලීන සාහිත්‍ය පිළිබඳ විචාරාත්මක හා විමර්ශනාත්මක සමාලෝචන වේ. ඒවායේ සාරසංක්ෂේපය (Abstract) (වචන 200-250), මුඛ්‍ය පද (key words) 3-6, පවතින පර්යේෂණ පිළිබඳ හොඳින් අවධානය යොමු කළ, සංවිධානාත්මක හා විචාරාත්මක විමර්ශනයක් සහ APA7 ශෛලියට අනුව ආශ්‍රිත ග්‍රන්ථ ලැයිස්තුවක් අඩංගු විය යුතුය. සමාලෝචන ලිපි සඳහා වචන සීමාව 5,000 සිට 6,000 දක්වා වේ. (රූප සටහන්, වගු සහ ආශ්‍රිත ග්‍රන්ථ ඇතුළුව)

**(ඇ) පර්යේෂණ සන්නිවේදන**

පර්යේෂණ සන්නිවේදන යනුවෙන් අදහස් කරන්නේ ඉක්මන් පළකිරීමකට සුදුසු, සීමිත විෂය පථයක, නිශ්චිත අදාළ ක්ෂේත්‍රයක, වැදගත් නව සොයාගැනීම් සන්නිවේදනය කිරීමයි. ඒවායෙහි සාරසංක්ෂේපය (Abstract) (වචන 200-250), මුඛ්‍ය පද (key words) 3-6, හැඳින්වීම, සාහිත්‍ය විමර්ශනය, ක්‍රමවේදය, ප්‍රතිඵල සහ සාකච්ඡාව, නිගමන සහ නිර්දේශ (අදාළ පරිදි) සහ APA7 ශෛලියට අනුව ආශ්‍රිත ග්‍රන්ථ ලැයිස්තුවක් ඇතුළත් විය යුතුය. පර්යේෂණ සන්නිවේදන සඳහා වචන සීමාව 2,000 සිට 3,000 දක්වා වේ. (රූප සටහන්, වගු සහ ආශ්‍රිත ග්‍රන්ථ ඇතුළුව)

**අත්පිටපත් ඉදිරිපත් කිරීම**

**-** අත්පිටපත් අත්‍යවශ්‍යයෙන්ම JIPE ශාස්ත්‍රීය සංග්‍රහයේ විෂය පථයට අයත් විය යුතුය.

-ඉංග්‍රීසි, සිංහල, හෝ දෙමළ භාෂාවෙන් අත්පිටපත් ඉදිරිපත් කළ හැකිය.

-අත්පිටපත්, මෙහි දී අධ්‍යයනයට සහභාගිවන්නන්ගේ රහස්‍යභාවය සහ නිර්නාමිකභාවය සහතික කිරීම, නිසි අවසරයකින් යුත් තොරතුරු පමණක් පළ කිරීම, සහ සාවද්‍ය තොරතුරු පළ නොකිරීම වැනි සම්මත ආචාරධර්ම පිළිවෙත් අනුගමනය කළ යුතුය.

- ශාස්ත්‍රීය ලේඛන ශෛලියට අනුකූලව ලිපි පැහැදිලිව හා සංක්ෂිප්තව ඉදිරිපත් කළ යුතුය.

- අත්පිටපත දෝෂවලින් තොර විය යුතු අතර JIPE හි ආකෘතියට අනුව සකස් කළ යුතුය.

– අදාළ අකුරු ඉංග්‍රීසි- Times New Roman; සිංහල- යුනිකෝඩ් (Unicode); දෙමළ- යුනිකෝඩ් (Unicode) විය යුතු අතර, අක්ෂර විශාලත්වය (font size) 12 විය යුතුය. අක්ෂර පේළි අතර ද්විත්ව පරතරය (double-spacing) සහිතව, පිටුවේ සෑම පැත්තකින්ම 1” මායිම් තීරුවක් සහිතව, තනි තීරුවක් ලෙසින් (in a single column) අත්පිටපත ඉදිරිපත් කළ යුතු අතර, පිටු අනුපිළිවෙලින් අංකනය කළ යුතුය.

- පෙළ සැකසුම (formatting) සහ ආශ්‍රිත ග්‍රන්ථ ඉදිරිපත් කිරීම ඇමරිකානු මනෝවිද්‍යා සංගමයේ ප්‍රකාශන අත්පොතට (APA 7th ed.) අනුගත විය යුතුය. සංස්කාරක මණ්ඩලයට අත්පිටපත්වල සංස්කරණ සිදු කළ හැකියි.

- සමාලෝචන ලිපි හැර අනෙකුත් අත්පිටපත් පහත පරිදි සංවිධානය කළ යුතුය: මාතෘකාව, සාරසංක්ෂේපය (Abstract), මුඛ්‍ය පද (key words), හැඳින්වීම, සාහිත්‍ය විමර්ශනය, ක්‍රමවේදය, ප්‍රතිඵල සහ සාකච්ඡාව, නිගමන සහ නිර්දේශ, උපකාරානුස්මෘතිය (Acknowledgement) (අදාළ පරිදි) සහ ආශ්‍රිත ග්‍රන්ථ ලැයිස්තුව

-පහත දැක්වෙන අනුපිළිවෙලින් පිටු සකස් කළ යුතුය.

**කවර පිටුව (Cover page):** කවර පිටුවෙහි අත්පිටපතේ මාතෘකාව, සියලුම කර්තෘවරුන්ගේ නම්, අනුබද්ධතා (affiliations), සහ ORCID හැඳුනුම්පත, සහ අදාළ ප්‍රධාන කර්තෘගේ සම්බන්ධතා තොරතුරු (contact information) ඇතුළත් විය යුතුය. කිසියම් පර්යේෂණ සැසියක දී/සම්මන්ත්‍රණයකදී පර්යේෂණය සාරසංක්ෂේපයක් (Abstract) ලෙස / විස්තෘත සාරසංක්ෂේපයක් (Extended abstract) ලෙස ප්‍රකාශයට පත් කර ඇත්නම්, එය පාද සටහනක් (footnote) ලෙස සඳහන් කළ යුතුය.

**මාතෘකා පිටුව (Title page):** මාතෘකා පිටුවෙහි ලිපියේ අන්තර්ගතය නිවැරදිව හා සංක්ෂිප්තව පිළිබිඹු විය යුතු වේ. මාතෘකාව උපරිම වචන 12 ක් විය යුතුය. මාතෘකා පිටුවේ කර්තෘ තොරතුරු කිසිවක් සඳහන් නොකළ යුතුය

**සාරසංක්ෂේපය (Abstract):** ලිපියේ ප්‍රධාන කරුණු සාරාංශ කරන, ආසන්න වශයෙන් වචන 200-250ක සාරසංක්ෂේපයක් සපයන්න. එය තනි ඡේදයක් ලෙස ලිවිය යුතු අතර කිසිදු මූලාශ්‍රයක් අඩංගු නොවිය යුතුය.

**මුඛ්‍ය පද (Key words):** අධ්‍යයනයට අදාළ වැදගත් වචන හෝ වාක්‍ය ඛණ්ඩ උපරිම හයක් (6) ඇතුළත් කරන්න.

**පත්‍රිකාව:** පූර්ණ පර්යේෂණ පත්‍රිකාවට (සමාලෝචන ලිපි හැර) හැඳින්වීම, සාහිත්‍ය විමර්ශනය, ක්‍රමවේදය, ප්‍රතිඵල සහ සාකච්ඡාව, නිගමන, නිර්දේශ, උපකාරානුස්මෘතිය (Acknowledgement) (අදාළ තැන්වල), සහ ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය ඇතුළත් වේ.

**ලේඛක සටහන්**: එක් එක් කතුවරයා පිළිබඳ තොරතුරු වචන 50කට නොවැඩිව වෙනම පිටුවක ඉදිරිපත් කරන්න.

**- රූප සටහන් සහ වගු:** සියලුම රූප සටහන් සහ වගු ලිපියේ අන්තර්ගතයේ සුදුසු ස්ථානවල සටහන් කළ යුතුය. රූප සටහන් සහ වගු අරාබි ඉලක්කම්වලින් අංකනය කළ යුතුය.

**- ඉදිරිපත් කිරීමේ කාණ්ඩ**: ඉදිරිපත් කිරීමේ කාණ්ඩය කවර පිටුවේ පැහැදිලිව සඳහන් කළ යුතුය. (පර්යේෂණ ලිපියක්, සමාලෝචන ලිපියක්, හෝ පර්යේෂණ සන්නිවේදනයක් ආදී වශයෙන්)

**කර්තෘ ලැයිස්තුව**: දායක වූ සියලුම සම-කර්තෘවරුන් කර්තෘ ලැයිස්තුවට ඇතුළත් කර ඇති බවට සහ පර්යේෂණ ලිපිය ප්‍රකාශනය සඳහා ඔවුන් එකඟ වී ඇති බවත් ප්‍රධාන කතුවරයා සහතික විය යුතුයි. ඉදිරිපත් කිරීමෙන් පසු කර්තෘවරුන්ගේ නම් හෝ කර්තෘවරුන්ගේ නම් අනුපිළිවෙලෙහි කිසිදු වෙනසක් පිළිගනු නොලැබේ.

**ORCID ID**: කර්තෘවරුන් ඔවුන්ගේ වලංගු පෞද්ගලික ORCID හැඳුනුම්පත (https://orcid.org/) සැපයිය යුතුයි. පළ කරන ලිපියේ පළමු පිටුවේ එය ප්‍රදර්ශනය කරනු ලැබේ.

**නිසි අවසරයකින් තොරව තොරතුරු පළ කිරීම :** සියලුම ඉදිරිපත් කිරීම් ලේඛන චෞරතාව හඳුනාගැනීමේ මෘදුකාංගයකට (plagiarism detection software) යටත් කෙරෙන අතර, එම වාර්තාව සහ සංස්කාරක මණ්ඩලයේ විනිශ්චය මත පදනම්ව කතුවරයාට/වරුන්ට උපදෙස් දෙනු ලැබේ.

**ඉදිරිපත් කිරීම සූදානම් කිරීමේ පිරික්සුම් ලැයිස්තුව**

* කරුණාකර ඔබගේ අත්පිටපත ඉදිරිපත් කිරීමට පෙර පහත සඳහන් සියලු නිර්ණායක සපුරා ඇති බවට සහතික වන්න.

* කිසියම් නිර්ණායකයකට අනුකූල නොවීම අත්පිටපත ප්‍රතික්ෂේප කිරීමට හේතු විය හැක.

✔ මෙම ඉදිරිපත් කිරීම මින් පෙර ප්‍රකාශයට පත් කර හෝ වෙනත් ශාස්ත්‍රීය සංග්‍රහයකට ඉදිරිපත් කර නොමැත.

✔ අත්පිටපත ශාස්ත්‍රීය සංග්‍රහයේ විෂය පථයට අනුකූල වේ.

✔ අත්පිටපතෙහි කර්තෘ තොරතුරක් නොමැති අතර කර්තෘ විස්තර කවර පිටුවේ වෙන වෙනම ඉදිරිපත් කෙරේ.

✔ ඉදිරිපත් කිරීමේ කාණ්ඩය කවර පිටුවේ පැහැදිලිව දක්වා ඇත. (පර්යේෂණ ලිපියක්, සමාලෝචන ලිපියක්, හෝ පර්යේෂණ සන්නිවේදනයක් යනාදී වශයෙන්)

✔ අත්පිටපත අදාළ කාණ්ඩය යටතේ අවම සහ උපරිම වචන සීමාවන් තුළ ඇත.

✔ ඉංග්‍රීසි භාෂාවෙන් ඉදිරිපත් කළ, උපරිම වචන ගණන 250ක් වූ සාරසංක්ෂේපය (Abstract) ඇතුළත් වේ.

✔ ඉංග්‍රීසි භාෂාවෙන් මුඛ්‍ය පද (key words) (3-6 ක්) ඇතුළත් වේ.

✔ මාතෘකාව උපරිම වචන 12ක් සහිතව ඉදිරිපත් කෙරේ.

✔ අත්පිටපතෙහි භාෂා නිරවද්‍යතාව සහ ලේඛන චෞරතාවෙන් (plagiarism) තොර බව පරීක්ෂා කර ඇත.

✔ ලිපියේ අන්තර්ගතය, මාර්ගෝපදේශවල දක්වා ඇති ශෛලීය අවශ්‍යතාවලට අනුගත වේ.

✔ වගු සහ රූප සටහන් නිවැරදිව අංකනය කර ලේබල් කර ඇත.

✔ පෙළ තුළ (in-text) මූලාශ්‍ර සටහන් කිරීම සහ ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය දැක්වීම APA7 ශෛලිය අනුගමනය කරමින් ඉදිරිපත් කර ඇති අතර, පවතින DOI හෝ URL ලබා දී ඇත.